2568 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2024

(03) අභිධර්මය

ලකුණු බෙදියාම

- I කොටසේ ප්‍රශ්නය ද II වන කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

I කොටස

1. ප්‍රශ්නය

(i) හා (ii) කොටස් සඳහා = ලකුණු 02 බැගින් 02 × 2 = ලකුණු 04

(iii) සිට (x) දක්වා කොටස් සඳහා = ලකුණු 03 බැගින් 03 × 8 = ලකුණු 24

I කොටසට නියමිත මුළු ලකුණු = ලකුණු 28 යි

II කොටස

ප්‍රශ්න අංක 1 සිට 7 වන ප්‍රශ්න සඳහා

(i) වන කොටසට = ලකුණු 05 යි

(ii) වන කොටසට = ලකුණු 06 යි

(iii) වන කොටසට = ලකුණු 07 යි

ලකුණු 18 යි

I	**වැනි කොටස සඳහා**	**ලකුණු**	28 යි
II	**වැනි කොටස සඳහා**	**ලකුණු**	72 යි
	මුළු ලකුණු	**ලකුණු**	100 යි

Past Papers Wiki

ලකුණු දීමේ පටිපාටිය

I කොටස

1.

(i) ලෝකය හා සත්ත්වයා පිළිබඳව මූල ධාතූන් වශයෙන් විභාග කොට දක්වන්නාවූ ද, මූල ධාතූන් පරම්පරා වශයෙන් පවත්නා ආකාරය පැහැදිළි කරන්නාවූ ද සම්මුති සත්‍යයෙන් බැහැරව ලෝකය විග්‍රහ කරන්නාවූ ද, සත්ත්වයාගේ අවසානය ලෙස නිර්වාණ ධාතුව විභාග කොට දක්වන්නා වූ ද, ලෝකයේ සම්මුති වශයෙන් බැහැරව පවත්නා සත්‍ය දේ දක්නාවූ ද ධර්මය පරමාර්ථ ධර්මය යි.

(ලකුණු 02 යි)

(ii) ථෙරවාදී නිකායක් වූ සර්වාස්තිවාද අභිධර්ම සම්ප්‍රදාය

(ලකුණු 02 යි)

(iii)

(අ) අන්තර්ගත ධර්මස්කන්ධ සංඛ්‍යාව දෙසාළිසකි. හෙවත් 42000 කි.

(ලකුණු 01 යි)

(ආ) සුවිශේෂී ලක්ෂණ

1. නිදාන දෙකක් පැවතීම
2. පාරිභාෂික පද භාවිතය
3. නිශ්චිත අර්ථ සහිතව කරුණු දැක්වීම
4. කරුණු ප්‍රභේදගතව දැක්වීම
5. වර්ණනාත්මක ශෛලිය වෙනුවට ශාස්ත්‍රීය භාෂා සම්ප්‍රදායන් අනුගමනය කිරීම
6. සම්මුති සත්‍යයෙන් තොරව - පරමාර්ථ සත්‍ය පමණක් ඉදිරිපත් කිරීම

(එක් නිවැරදි කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02 ක් සඳහා 01 × 2 = ලකුණු 02 යි)

(iv)

(අ) චිත්ත

(ආ) චෛතසික

(ඉ) රූප

(ඊ) නිර්වාණ

(ලකුණු 03 යි)

(v)

- උපේක්ඛා සහගත උද්ධච්ච සම්පයුක්ත සිත

(ලකුණු 01 යි)

- හදිසියේ පැමිණෙන හේතු නිසාත් එකවර වැඩ කිහිපයක් කරන අවස්ථාවලදීත් සිතේ ඇතිවන නොසන්සුන් බව විපිළිසර බව ප්‍රතිසන්ධි විපාකයක් ලබාදීමට තරම් ප්‍රබල නොවේ.

(ලකුණු 02 යි)

(vi)

(අ)
- කාය විඤ්ඤත්ති
- වචී විඤ්ඤත්ති

(01 × 2 = ලකුණු 02 යි)

(ආ) වචී විඤ්ඤත්ති යනු වචනය භාවිත කිරීමේ හැකියාව හෙවත් වාග් ද්වාරය භාවිත කොට, කුසල් -. අකුසල් සිදුකර ගැනීමේ හැකියාව

(ලකුණු 01 යි)

(vii)

(අ)
1. පඨවි
2. ආපෝ
3. තේජෝ
4. වායෝ

(ලකුණු 02 යි)

(ආ) ලෝකය හා සත්ත්වයා නිර්මාණය වීමේ දී මේ සතර ධර්ම සියල්ලම අනිවාර්යයෙන්ම සම්බන්ධ වන නිසා ඒවා මහාභූත නම් වේ.

අනෙක් රූප - 24 පවත්නේ ද මේ මහා භූත හතර උපයෝගි කරගෙනය. ඒ නිසා ඒවා උපාදාය රූප ලෙස හඳුන්වයි.

(ලකුණු 01 යි)

PAST PAPERS WIKI

(viii)

(අ) බොරු කීම (මුසාවාදා)

(ආ) කේලාම් කීම (පිසුණාවාචා)

(ඉ) එරුෂ වචන කීම (ඵරුසාවාචා)

(ඊ) හිස් වචන කීම (සම්පප්ඵලාපා)

(½ × 4 = ලකුණු 02 යි)

අන්‍යයන් රවටන අදහසින් සිදු නොවූ දෙයක් සිදුවුවා සේ ඒත්තු ගන්වමින්, තහවුරු කරමින් ප්‍රකාශ කිරීම.

(ලකුණු 01 යි)

(ix)

(අ) උප්පාදෝ පඤ්ඤායති (උපත පැහැදිලි වේ)

(ආ) වයෝ පඤ්ඤායති (විනාසය පැහැදිලි වේ)

(ඉ) ඨිතස්ස අඤ්ඤතත්ථං පඤ්ඤායති (වෙනස්වෙමින් පැවැත්ම පැහැදිලි වේ)

(නම් කිරීමට ලකුණු 01 යි)

එයින් දෙකක් හැඳින්වීමට

(ලකුණු 02 යි)

(x) (අ) සීල = කය වචන දෙකෙහි සංවරතාව හෙවත් තැන්පත් බව

(ආ) සමාධි = කුසල් අරමුණක බෝහෝ වේලාවක් සිත ඒකග්‍ර කර ගැනීමේ හැකියාව

(නම් කිරීමට ලකුණු 01 යි, හැඳින්වීම් දෙකට ලකුණු 02 යි)

(මුළු ලකුණු 28 යි)

II කොටස

1.

(i) (අ) විතක්ක විචාර පීති සුඛ ඒකග්ගතා සහිත පඨමජ්ඣාන කුසල් සිත

(ලකුණු 01 යි)

(ආ)

- විතක්ක - යෝගාවචරයාගේ සිත නැවත නැවත අරමුණට යොමු කිරීම.
- විචාර - අරමුණ මෙනෙහි කරමින්, පිරිමදිමින් පසුවීම
- පීති - සිතේ ප්‍රබෝධයක් ඇතිවීම
- සුඛ - සුඛාස්වාදයක් ඇතිවීම
- ඒකගග්ගතා - මුල් අංග හතර නිසා හිතේ සමාධිගත බව ප්‍රබලවීම

(ලකුණු 04 යි)

(ii) ත්‍රි හේතුක ප්‍රතිසන්ධියක් සහිත යෝගාවචරයෙක් කාම සුඛය ලාමක කොට සිතා බ්‍රහ්ම සුඛය විඳගන්නා අරමුණින් තමාගේ චරිතයට ගැලපෙන සමසතළිස් කර්මස්ථාන අතරින් සුදුසු අරමුණක් කම්මට්ඨානාචාර්ය වරයෙකුගෙන් ලබාගෙන දස පළිබෝධයෙන් දුරු වූ භාවනාවට සුදුසු ස්ථානයක් සොයාගෙන අවශ්‍ය පූර්ව කෘත්‍යයන් සිදුකර, භාවනාවට වාඩිවෙයි. එතැන් පටන් ධ්‍යානාංග හේතුවෙන් විතර්කය විසින් වරින් වර අරමුණ සිතට නගයි. අරමුණෙන් බැහැර වී නොයන ලෙස අරමුණෙහිම රඳවා ගැනීමට විචාරය උපයෝගි වේ. භාවනාව කරගෙන යන අතර තුර අරමුණ විසින් සිතේ ඇතිවන සතුට ලබාදෙන්නේ පීති නම් වූ තෙවැනි ධ්‍යානාංගයෙනි. අරමුණේ රසය - සුඛය නම් වූ ධ්‍යානාංගය විසින් ලබා දේ. ඒකග්ගතා ධ්‍යානාංගය - සබ්බචිත්ත සාධාරණ චෛතසිකයක් වූ ඒකග්ගතාව ධ්‍යානය ඇතිවීම කෙරෙහි බලපායි.

(ලකුණු 06 යි)

(iii) නොපිරිහුණු ප්‍රථම ධ්‍යානලාභීයාගේ ප්‍රතිසන්ධිය ආරම්භක බ්‍රහ්ම ලෝක තුනෙහි ප්‍රතිසන්ධිය ලැබීම යි. එම ප්‍රතිසන්ධිය කර්මය පිළිබඳවූ ප්‍රතිසන්ධි චතුෂ්කයට අයත් වූ තෙවැනි රූපාවචර ප්‍රතිසන්ධියයි. ධ්‍යානය වැඩීමේ දී පරිත්ත වශයෙන් මධ්‍යම වශයෙන් හා ප්‍රනීත වශයෙන් යන තුන් වැදෑරුම් ධ්‍යානය වැඩීමේ ආකාරය අනුව බ්‍රහ්මලෝක තුනෙහි ප්‍රතිසන්ධිය සිදු වේ. පරිත්ත වශයෙන් ධ්‍යානය ලබාගත් පුද්ගලයා මරණින් මතු බ්‍රහ්ම පාරිසජ්ජයේ උපත ලබයි. එහි පරමායුෂ අසංඛ්‍ය කල්ප 1/3 කි. මධ්‍යම වශයෙන් ධ්‍යානය ලබාගත් පුද්ගලයා මරණින් මතු බ්‍රහ්ම පාරිසජ්ජ නම් වූ පරමායුෂ අසංඛ්‍ය කල්ප 1/2 ක් වූ බ්‍රහ්ම ලෝකයේ උපත ලබයි. ප්‍රනීත වශයෙන් ධ්‍යානය ලබාගන්නේ නම් මහා බ්‍රහ්මයෙහි ප්‍රතිසන්ධිය ලබයි. එහි පරමායුෂ අසංඛ්‍ය කල්පයකි. නොපිරිහුණු පඨමජ්ඣාන කුසල චිත්තයේ ප්‍රතිසන්ධිය ඒ අනුව පැහැදිලි කළ හැකිය.

(ලකුණු 07 යි)
(මුළු ලකුණු 18 යි)

2.

(i) චෛතසික බෙදෙන ප්‍රධාන ප්‍රභේද තුනකි. හෙවත් රාශී තුනකි

1. අඤ්ඤසමාන රාශිය	-	චෛතසික සංඛ්‍යාව 13	සියලු චෛතසික සංඛ්‍යාව 52
2. අකුසල රාශිය	-	චෛතසික සංඛ්‍යාව 14	
3. සෝභන රාශිය	-	චෛතසික සංඛ්‍යාව 25	

(අ) - (නම් කිරීමට ලකුණු 03 යි)

(ආ) - (සංඛ්‍යාව නිවැරදිව දැක්වීමට ලකුණු 02 යි)

Past Papers Wiki

(ii) 1. සම්මා වාචා

2. සම්මා කම්මන්ත

3. සම්මා ආජීව

(ලකුණු 01 × 3 = ලකුණු 03 යි)

සතර වැදැරුම් වාග් දුශ්චරිතයෙන් හා තෙවැදැරුම් කාය දුශ්චරිතයෙන් ද වැරදි ජීවනෝපාය ක්‍රමයන්ගෙන් ද වැළකීම, වෙන්වීම හෙවත් විරමණය, විරතිය ලෙස දැක්වේ.

(ලකුණු 03 යි)

(iii) පුද්ගලයෙකුට තමා ජීවත්වන සමාජය තුළ කටයුතු කිරීමේ දී අන්‍යයන් සමඟ සුහදව මෙන්ම සමාජයීය යහපැවැත්මකින් යුතුව පැවැතිය යුතුය. අනෝන්‍ය විශ්වාසය, එකිනෙකා කෙරෙහි ගෞරවය, සුහද බව, මිත්‍රත්වය, උපකාරය, ඔවුනොවුන් කෙරෙහි කාරුණික බව, රැකවරණය සැලසීම ආදී ගුණාංග ක්‍රියාවෙන්ම තහවුරු කළ යුතුය. ඒ සඳහා කයින් කෙරෙන වැරදි නොකර සිටීමෙන් හෙවත් සිල්වත් වීමට පළමු හා දෙවැනි විරති චෛතසික බෙහෙවින් බලපායි. විශ්වාස කළහැකි ප්‍රියමනාප වචන ඇත්තෙකු වීම, මෙන්ම කයින් කෙරෙන අකුසලයෙන් වෙන් වූ පුද්ගලයෙකු බව තහවුරු කළ යුතුය. දිවි පෙවෙත ධර්මානුකූල වූ එකක් විය යුතු අතර ඒ සඳහා සම්මා ආජීවය වැදගත් වේ.

(මේ කරුණු ඇසුරෙන් ලියා ඇති උදාහරණ සහිත පිළිතුරට ලකුණු 07 යි)

(මුළු ලකුණු 18 යි)

3.

(i) (අ)

වීථි සිත්වල මූලික ප්‍රභේද දෙකකි.

1. පඤ්චද්වාරික චිත්ත වීථි
2. මනෝද්වාරික චිත්ත වීථි

(1) පඤ්චද්වාරික චිත්ත වීථි යනු චක්ඛු සෝත ඝාණ ජිව්හා කාය යන පස්වැදැරුම් දොරටුවලින් ලැබෙන රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බා යන අරමුණු හේතුවෙන් හටගන්නා චිත්ත වීථි ලෙස හැඳින්විය හැකිය.

(2) මනෝ ද්වාරික චිත්ත වීථි යනු මනසට අරමුණුවන ධම්මාරම්මණයක් හේතුවෙන් හටගන්නා චිත්ත වීථීන් ය.

(ලකුණු 02 යි)

(ආ)

1. උප්පාද
2. ඨිති
3. භංග

උප්පාද ක්ෂණය	-	සිත ඉපදීම හෙවත් උප්පාද ඣානය
ඨිති ක්ෂණය	-	සිත පවතින අවස්ථාව
භංග ක්ෂණය	-	සිතේ බිඳීම හෙවත් අවසන් වීම

(ලකුණු 03 යි)

(ii) චිත්ත වීථි සටහන - ජවිහාද්වාරික අතිමහන්තාරම්මණ චිත්ත විථිය

1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14	15	16	17	
භ	භ	ත	ත	ත	ත	ත	ත	ත	ත	ත	ත	ත	ත	ත	ත	ත	ත
නි	න	ද	පං	ජී	සං	ණ	වෝ	ජ	ජ	ජ	ජී	ජ	ජ	ජ	ත	ත	භ

(ලකුණු 03 යි)

සම්පටිච්ඡන	-	අරමුණ පිළිගැනීම
සන්තීරණ	-	අරමුණ තීරණය කිරීම
වොත්තපන	-	අරමුණ යොමු කිරීම

(ලකුණු 03 යි)

(iii)

1. චිත්ත වීථියේ පළමු භවාංග සිතටම අරමුණු ගැටීම
2. අරමුණු ඉතා පැහැදිලි වීම
3. පැහැදිලි මනසිකාරයක් පැවතීම
4. 9 වැනි චිත්ත වීථි ක්ෂණයෙන් ජවන් සිත් ආරම්භ වීම
5. 15 වැනි වීථි ක්ෂණයෙන් ජවන් සිත් අවසන් වීම
6. තදාලම්බන සිත් දෙකක් අවසානයේ පැවතීම

(ලකුණු 07 යි)

(මුළු ලකුණු 18 යි)

4.

(i)

(අ) ගබ්බ සෙය්‍යක සත්ත්වයන් යනු මව් කුසක හටගන්නා සත්ත්වයින් ය. අණ්ඩජ, ජලාබුජ, සංසේදජ, ඕපපාතික යන උත් පත්ති සතරෙන් අණ්ඩජ හා ජලාබුජ සත්ත්වයින් දෙකොටස ගබ්බසෙය්‍යක සත්ත්වයින් ලෙස සැලකේ.

(ලකුණු 02 යි)

(ආ) මහාභූත රූප : 4
උපදාය රූප : 24
} සීත උෂ්ණ ආදී විරුද්ධ ප්‍රත්‍යයන් ඇති කල්හී වෙනස්වීමට පැමිණෙන නිසා රූප නමින් හැඳින්වේ.

(ලකුණු 03 යි)

(ii)

1. උපචය - ප්‍රථමව උපදින මතු වැඩෙන රූප උපචය නම් වේ.
2. සන්තති - උපචයේ පටන් අවසන් වනතුරු සවිඥානික හෝ අවිඥාණිකව පවත්නා රූප
3. ජරතා - ඒ ඒ රූපයන්ගේ දිරාපත් වීම හා ජරාවට පත්වීම
4. අනිච්චතා - සැමදා එකසේ නොපැවැතී විනාස වීම

චිත්ත වීථියක දී නම් ප්‍රථම චිත්තක්ෂණ අවස්ථාව උපචය ලෙස ද ඊළඟට ඇති දෙවැනි චිත්තක්ෂණයේ සිට 15 චිත්තක්ෂණය දක්වා සන්තති අවස්ථාව ලෙසද, සොළොස්වන අවස්ථාව ජරතා අවස්ථාව ලෙසද, 17 අවස්ථාව අනිච්චතාව ලෙස ද සැලකිය හැකිය.

(ලකුණු 06 යි)

(iii) මිනිසා සමාජය තුළ ජීවත්වීමේ දී, කබලිංකාරාහාරය, ඵස්ස ආහාරය, මනොසංචේතනාහාරය, විඤ්ඤාණආහාරය යන සතර වැදැරුම් ආහාරයන් ලබා ගනිමින් කටයුතු කළ යුතු වේ. රූප කලාප වර්ධනයට පෝෂ්‍ය පදාර්ථ ලබා ගන්නේ කබලිංකාරාහාරයෙනි. එය ජීවිතය පවත්වා ගැනීමට උපකාරී වේ. අපි ආහාරයට ගන්නා කෑමබීම් ආදිය ඊට උදාහරණ වේ. එයින් ලැබෙන ඕජාවෙන් ශරීරය පෝෂණය වේ. හෙවත් රූප කලාප පෝෂණය වේ. සෙසු ආහාර වර්ග තුනම නාම ධර්ම වේ. ජීවත්වන කාලය පුරා ඉඳුරන්ට ලැබෙන අරමුණු ඵස්සාහාරය යි. ඒ අනුව සිත ක්‍රියාත්මක වේ. කුසල් අකුසල් ඇති වීමට බලපායි. තණ්හා උපාදානාදි කුසල අකුසල චෛතසික උපදී. මනසට ලැබෙන අරමුණු මනෝසංචේතනාහාරය යි. සිතින් සිතමින් සමාජය තුළ කටයුතු කිරීමට මේ ආහාරය වැදගත් වේ. සංඥාවිපල්ලාස හටගනී. යථාර්ථය නොපෙනී යයි. ඇති තතු එසේම නොපෙනේ මේ සඳහා යෝනිසෝමනසිකාරය වැඩිය යුතුය.

(ලකුණු 07 යි)

(මුළු ලකුණු 18 යි)

5.

(i)

(අ)

- මෙත්තා
- කරුණා
- මුදිතා
- උපේක්ඛා

(ලකුණු 02 යි)

(ආ) **<u>මුදිතා</u>**

තෙවැනි බ්‍රහ්ම විහාරය වන්නේ මුදිතාවයි. මෙය කුසල චෛතසික අතර 23 වැනි චෛතසිකය යි. බ්‍රහ්ම විහාර අතර තෙවැන්න යි. මින් අදහස් කරන්නේ අන් අයගේ දියුණුව දැක තමාට නැති සැප සම්පත් ඔවුනට ලැබෙනු දැක සතුටු විය හැකි ගුණයයි.

(ලකුණු 03 යි)

(ii)

- ඉද්ධිවිධ ඤාණය
- දිබ්බයෝත ඤාණය
- පරචිත්තවිජානන ඤාණය
- පුබ්බේනිවාසානුස්සති ඤාණය
- දිබ්බචක්ඛු ඤාණය

(ලකුණු 05 යි)

අභිඥා පාදක, රූපාවචර, පංචමධ්‍යාන චිත්තයෙන් අෂ්ට සමාපත්තිලාභී උතුමන්ට අභිඥා ඉපදවිය හැකිය. අභිඥාලාභීන්ට ද සියලු අභිඥා ලැබෙන්නේ නැත. ඇතමෙකුට එකක් දෙකක් පමණක් සාධනය වේ. ඇතමෙකුට අභිඥා පහම ලැබේ. එසේ වීමට හේතුව තම තමන් පරිකර්ම කළ අභිඥ ලැබීමට සුදුසු අරමුණු මෙනෙහි කළ බැවිනි. අභිඥලාභි ධ්‍යාන ලාභියෙකුට තමන් සිතූ තරමින් ඒ සිතන දේ ඉටු වේ.

(ලකුණු 01 යි)

(iii) මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන ගුණ ධර්ම සතර බ්‍රහ්ම විහාර නමින් හැඳින්වේ. අප්‍රමාණ වූ සත්ත්වයන් කෙරේ අරමුණු කරගෙන පවත්වන බැවින් මෙත්තා, කරුණා යන ධර්ම දෙක අප්පමඤ්ඤා චෛතසික වශයෙන් ද හඳුන්වයි. එහි පළමුවැන්න මෛත්‍රීය යි. හෙවත් මිත්‍රත්වය යි. ද්වේෂයේ ආදීනව සහ ක්ෂාන්තියේ ආනිසංස නුවණින් හඳුනාගැනීමෙන් මෛත්‍රිය කෙරේ යොමුවිය හැකිය. මෛත්‍රීය භාවනාවක් ලෙස වැඩීමේ දී ප්‍රියයන් කෙරෙහිද අප්‍රියන් කෙරෙහිද වෛරීන් කෙරෙහිද ලිංග විසමභාගයන් කෙරේ ද නොවඩා පළමුව තමා කෙරෙහි මෛත්‍රීය වැඩිය යුතුය. කරණීයමෙත්ත සූත්‍රය මෙත් වැඩිය යුතු ආකාරය දැක්වීම හොඳ උදාහරණයකි. මෛත්‍රීය වැඩීම නිසා ලැබෙන ආනිසංස එකොළහක් මෙත්තානිසංස සූත්‍රයේ දැක්වේ. අසුරු සනක් ගහන පමණක් කාලය තුළ මෛත්‍රීය වැඩිය හැකි නම් එය මහත් වූ ආනිසංස ගෙන දෙන බව බුදුරජාණන් වහන්සේගේ දේශනාවයි.

(ලකුණු 07 යි)

(මුළු ලකුණු 18 යි)

6.

(i) (අ)

කර්ම යනු කුසලාකුසල දෙවර්ගයටම පොදු වූ හැදින්වීමකි. ලෝභ, දෝස, මෝහ යන අකුසල ත්‍රිකයෙන් දෙකක් හෝ එකක් මුල්වීමෙන් අකුසල කර්ම සිදුකෙරෙන අතර අලෝභ, අදෝෂ, අමෝහ යන කුසල ත්‍රිකය මුල්වීමෙන් කුසල් කර්ම සිදු වේ. කුසල අකුසල දෙකොටසම සිදු කෙරෙන දොරටු තුනකි. ඒවා කාය, වාග් සහ මනෝද්වාර ලෙස හඳුන්වයි. මේවා පුද්ගලයා තුළ පවත්නා දොරටු වේ. කර්මය සංකල්පය වශයෙන් එකක් ලෙස හැඳින්වුවද එය අභිධර්මයේ දී චතුෂ්ක හතරක් ලෙස පැහැදිලි කරයි.

(ලකුණු 02 යි)

(ආ)

විපාක යනු කවර හෝ චේතනාන්විතව කළ කුසල හෝ අකුසල කර්මයකට විපාක හෙවත් ප්‍රතිඵලයක් ලෙස ලැබෙන දේය. කවර හෝ චේතනාන්විත වූ කර්මයකට ලැබෙන විපාක වර්ග දෙකකි. ඒවා ප්‍රතිසන්ධි විපාක සහ ප්‍රවෘත්ති විපාක ලෙස හඳුන්වයි. ප්‍රතිසන්ධි විපාකය යනු මරණින් පසු නැවත උපතක් ලබා දීමට බලපාන කර්මය. ප්‍රවෘත්ති විපාක යනු කිසියම් තැනෙක උපත ලැබූ පසු ජීවිතය පවත්වාගෙන යාමට උපකාරවන කර්ම වේ.

(ලකුණු 03 යි)

Past Papers Wiki

(ii) කර්මයෙන් කෙරෙන කෘත්‍ය හතර

- ජනක කර්මය
- උපස්ථම්භක කර්මය
- උප පීඩක කර්මය
- උපඝාතක කර්මය

(ලකුණු 02 යි)

- **ජනක කර්මය**

  කර්ම පථ බවට පත් වූ අකුසලයෙන් දුගතියකත්, කුසලයෙන් ඊට අනුරූප වූ සුගතියකත් ප්‍රතිසන්ධියක් ලබා ගැනීමට බලපෑම.

- **උපස්ථම්භක කර්මය**

  ප්‍රතිසන්ධියකින් පසුව ප්‍රවෘත්ති විපාක ලබාදෙන කාලයෙහි ලබාගත් ප්‍රතිසන්ධියට අනුරූපව උදව් කිරීම, සහයෝගය දැක්වීම.

- **උප පීඩක කර්මය**

  ලබාගත් ප්‍රතිසන්ධියට අනුව ලැබෙන ප්‍රවෘත්ති විපාකවලට බාධා පමුණුවන ඊට පීඩා කරන කර්ම අකුසලයට කුසලයෙන් ද, කුසලයට අකුසලයෙන්ද බාධාකාරී වේ.

- **උපඝාතක කර්මය**

  ලබාගත් ප්‍රතිසන්ධිය අනුව ලැබෙන ප්‍රවෘත්ති විපාකයන්ට හානි කරමින් ජීවිතය පවත්වා ගැනීමට ඉඩ නොතබා විනාශ කිරීම.

(ලකුණු 04 යි)

(iii) පුද්ගලයා සමාජගතව කටයුතු කිරීමේ දී අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධතා පවත්වා ගනිමින් පවත්නා පරිසරය සමග මුහුණ දීමට සිදුවන විවිධ ගැටලු හා පරිසර අත්දැකීම් සමඟ ගනුදෙනු කරමින් කටයුතු කළ යුතුය. එබඳු අවස්ථාවල අප පුරුදු වී සිටින්නේ සියල්ල කර්මානුරූපව සිදුවෙනවාය කියායි. එහෙත් බුදුරජාණන් වහන්සේ පුද්ගල ජීවිත පැවැත්මට බලපාන තවත් කාරණා හතරක් දේශනා කළහ. මේ සියල්ල එකටගත් විට එය හඳුන්වන්නේ නියාම ධර්ම සංකල්පය ලෙසිනි. ඒ අනුව පුද්ගලයා ජීවත් වීමේ දී අත්විඳින අත්දැකීම් සියල්ල කර්මයෙන් පමණක් උරුම නොවන අතර අනෙකුත් නියාම ධර්ම හතර ඊට බලපාන බව පැහැදිලි වේ.

(මේ කරුණු ඇසුරෙන් ලියා ඇති පිළිතුරට ලකුණු 07 යි)

(මුළු ලකුණු 18 යි)

Past Papers Wiki

7.

(i) (අ)

- අනුසය
- පරියුට්ඨාන
- වීතික්කම

(ලකුණු 02 යි)

(ආ)

- කාමරාගානුසය
- භවරාගානුසය
- පටිඝානුසය
- මානානුසය
- දිට්ඨානුසය
- විචිකිච්ඡානුසය
- අවිජ්ජානුසය

(මෙයින් හතරක් නම් කිරීමට ලකුණු 02 යි)

අනුසය යනු සත්ත්ව සන්තානයෙහි යටපත් වී හෙවත් නිදාගෙන සේ සිටින අවස්ථාවක් පැමිණි වහාම අවදි වී ක්‍රියාත්මක වන අකුසලයට යොමුකරන ධර්ම අනුසය ධර්ම නම් වේ.

(ලකුණු 01 යි)

(ii)

- සීල = වීතික්කම
  කාය වාග් ද්වාරයේ ක්‍රියාත්මකවීම සීලයෙන් යටපත් කෙරේ
- සමාධි = පරියුට්ඨාන
  සිත තුළ පමණක් සක්‍රියවීම සමාධියෙන් යටපත් කෙරේ
- ප්‍රඥා = අනුසය
  නිදා නොනිදා සිත තුළ සැඟව සිටීම ප්‍රඥාවෙන් යටපත් කෙරේ.

සීලයෙන් තදංග වශයෙන් අනුසය ධර්ම යටපත් කරන අතර සමාධියෙන් විශ්කම්භන වශයෙන් ප්‍රඥාවෙන් සමුච්ඡේද වශයෙන් ද අනුසය ධර්ම යටපත් කෙරේ.

(ලකුණු 06 යි)

(iii) ත්‍රී ශික්ෂාව සීල, සමාධි, ප්‍රඥා යන ධර්මතා සකල ක්ලේශයන් ප්‍රහීණය කෙරෙන ආකාරය ඉහත II කොටසේ සංක්ෂිප්තව දැක්වේ. අනුසය ධර්ම ප්‍රහීණය තුළින් රහත් භාවයට පත්වෙන උතුමා දස සංයෝජනයන් ද සම්පූර්ණයෙන්ම ප්‍රහීණය කරයි. මේ අනුව නිවන් මාර්ගය ලෙස ත්‍රිශික්ෂාව හඳුන්වන්නේ ඒ තුළ ආර්ය අෂ්ටාංගික මාර්ගය ද අන්තර්ගතව පවතින හෙයි.

PAST PAPERS WIKI

(මේ කරුණු ඇසුරෙන් ලියා ඇති පිළිතුරට ලකුණු 07 යි)

(මුළු ලකුණු 25 යි)

******

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library